ඔබ එම සියලු යහපත් ක්රියාවන් මත ඉස්ලාමය වැළඳ ගෙන ඇත" යැයි පිළිතුරු දුන්හ

හකීම් ඉබ්නු හිසාම් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, අඥාන යුගයේ මම පුණ්ය කටයුතු, වහලුන් නිදහස් කිරීම් සහ ඥාතී සබඳතා පැවැත්වීම් වැනි ක්රියාවන් සිදු කරමින් ආවෙමි. ඒවායෙහි මට යම් ප්රතිඵලයක්
තිබේ ද? ඒ ගැන ඔබේ අදහස කුමක් ද? යැයි විමසුවෙමි. එවිට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ "ඔබ එම සියලු යහපත් ක්රියාවන් මත ඉස්ලාමය වැළඳ ගෙන ඇත" යැයි
පිළිතුරු දුන්හ.
[صحيح] [متفق عليه]

දේවත්වය ප්රතික්ෂේප කළ තැනැත්තා විසින් ඉස්ලාමය වැළඳ ගැනීමට පෙර පුණ්ය කටයුතු හෝ වහලුන් නිදහස් කිරීම හෝ ඥාතී සම්බන්ධකම් පැවැත්වීම වැනි යහපත් ක්රියාවන් කිසිවක් සිදු කර තිබුණේ නම්, ඔහු ඉස්ලාමය වැළඳගත් අවස්ථාවේ ඒ සඳහා කුසල් ඔහුට ප්රදානය කරනු ලැබේ.

http://sunnah.global/hadeeth/si/show/65016